# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 276 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 15/02/2024<br>පැය 1945 |

## මාධ්‍ය නිවේදනය

**ජාතික රෝහල් චතුරස්‍රයේ රථවාහන පොලිස් මුරපොල විවෘත කිරීම - රථවාහන මූලස්ථානය.**

2024.02.15 වන අද දින උදෑසන ජාතික රෝහලේ බාහිර රෝගී අංශය ඉදිරිපිට දී රථවාහන පොලිස් මුරපොල වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය කුමාර වික්‍රමසිංහ මහතාගේ සහභාගීත්වයෙන් විවෘත කරන ලදී.

මහජන සෞඛ්‍යයට වැදගත් හා අත්‍යවශ්‍ය ආයතන රැසක් ජාතික රෝහල අවට පරිශ්‍රය තුල පිහිටා තිබීම හේතුවෙන් රෝහලේ වෛද්‍ය ඒකක වෙත දෛනිකව දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට පැමිණෙන මහජනතාවට, වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයට හා ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට ඔවුන් පැමිණෙන රථවාහන, රෝගීන් රැගෙන එන වාහන මෙන්ම ගිලන් රථ නිසි පරිදි හැසිරවීම මඟින් රෝහල අවට රථවාහන තදබදය අවම කර ගැනීම ඇතුළු සේවාවන් රැසක් ද මෙම රථවාහන පොලිස් මුරපොල මඟින් පහසුවෙන් ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත. මෙම රථ වාහන පොලිස් මුරපොල වෙත පොලිස් නිලධාරීන් 31 දෙනෙකු අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත.

මෙම අවස්ථාව සඳහා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන, කොළඹ මහ නගර සභාවේ කොමසාරිස් භද්‍රානි ජයවර්ධන ඇතුළු මහත්ම මහත්මීන් පිරිසක් සහභාගී විය.

ඡායාරූප


TRAFFIC POLICE POST
NATIONAL HOSPITAL SQUARE
OUTPATIENT CLINIC
TO CLINICS












මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.